- ***<u>බුද්ධි අංශ ප්‍රධානී සුරේෂ් සලේ අත්අඩංගුවට ගැනීම කොටි ඩයස්පෝරාව සතුටු කරන නරුම පාවාදීමක්...</u>***

- ***<u>රණවිරුවන් දඩයම් කර රාජ්‍යය බිඳවැට්ටවීමේ කුමන්ත්‍රණයට එරෙහිව ජාතියම පෙළගැසිය යුතුයි...</u>***

- ***<u>පාස්කු ප්‍රහාරය ගැන අනතුරු ඇඟවූ සලේ හිරේ - ප්‍රහාරයට අනුබල දුන් ඊබ්‍රාහිම්ලා නිදහසේ... ආණ්ඩුවේ ද්විත්ව පිළිවෙත හෙළිවේ.</u>***

- ජා නි පෙ නායක විමල් වීරවංශ

මේජර් ජනරාල් තුවාන් සුරේෂ් සලේ මහතා අත්අඩංගුවට ගැනීම යනු රටේ ජාතික ආරක්ෂාව සහ රාජ්‍යයේ පැවැත්ම බිඳවට්ටමින් දෙමළ ඩයස්පෝරාවේ උවමනාවන් ඉටු කිරීම සඳහා දියත් කර ඇති "දේශපාලන මෙහෙයුමක්" බව ජාතික නිදහස් පෙරමුණේ නායක විමල් වීරවංශ මහතා අද (27) ප්‍රකාශ කළේය. බත්තලමුල්ලේ පිහිටි පක්ෂ මූලස්ථානයේ පැවති මාධ්‍ය හමුවකදී ඒ මහතා මේ බව අවධාරණය කළේය.

යුධ සමයේදී එල්.ටී.ටී.ඊ. නායක තමිල්සෙල්වන් වැනි ඉලක්ක වෙත සාර්ථකව ප්‍රහාර එල්ල කිරීමට අවශ්‍ය බුද්ධි තොරතුරු සපයමින් රට වෙනුවෙන් සුවිශේෂී මෙහෙවරක් කළ නිලධාරියෙකු මෙසේ දඩයම් කිරීම හෙළා දකින බව වීරවංශ මහතා පැවසීය. පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් සහරාන් ඇතුළු අන්තවාදීන්ගේ ක්‍රියාකාරීත්වය පිළිබඳව යහපාලන රජයේ ආරක්ෂක මණ්ඩලයට මුලින්ම අනතුරු ඇඟවූයේ සලේ මහතා බවත්, එදා එම තොරතුරු නොසලකා හැර අද අනතුරු ඇඟවූ පුද්ගලයාම වැරදිකරු කිරීමට උත්සාහ කිරීම හාස්‍යජනක බවත් ඔහු පෙන්වා දුන්නේය.

වත්මන් රජය උතුරු - නැගෙනහිර හමුදා කඳවුරු ඉවත් කරමින් සහ බුද්ධි අංශ නිලධාරීන් සිරගත කරමින් ජාතික ආරක්ෂාව බිංදුවට ඇද දමා ඇති බවට ඔහු චෝදනා කළේය. "අන්ත ප්‍රතිගාමී පාලකයෙකු පවා

නිදහස් දින පෙළපාලියේදී රණවිරුවන් කළ සේවය ගැන කතා කිරීම තහනම් කළේ නැහැ. නමුත් අද රණවිරු කියන වචනය ඇහෙනකොට ජනාධිපතිවරයාගේ ඇඟ නළියනවා," යැයි වීරවංශ මහතා පැවසීය.

පාස්කු ප්‍රහාරයට සම්බන්ධ බවට චෝදනා එල්ල වූ ඊබ්‍රාහිම් වැනි පුද්ගලයන්ගේ දේපළ නිදහස් කරමින් ඔවුන් "සුද්ධ පවිත්‍ර" කරන අතරතුර, රට වෙනුවෙන් දිවි පරදුවට තැබූ සලේ වැනි නිලධාරීන් සිරගත කිරීම පිටුපස ඇති දේශපාලන න්‍යාය පත්‍රය ජනතාව තේරුම් ගත යුතු බව ඔහු වැඩිදුරටත් කියා සිටියේය. මේජර් ජනරාල් සලේ මහතා නිදහස් කර ගන්නා තෙක් මෙම සටන අත්නොහරින බවත්, පරාජිත ත්‍රස්තවාදීන් සතුටු කරන මෙම පාහර ක්‍රියාවට එරෙහිව ජාතියම පෙළගැසිය යුතු බවත් ඔහු සිය නිවේදනය මගින් අවධාරණය කරයි.

## *මාධ්‍ය සාකච්ඡාවේ කරුණු ඇතුළත් වාර්තාව.*

### *හැඳින්වීම සහ ඓතිහාසික පසුබිම:*

විමල් වීරවංශ මහතා සිය කතාව ආරම්භ කරමින් ජාතික නිදහස් පෙරමුණ සැමදා දේශපාලනිකව දේශහිතෛෂී ස්ථාවරයක සිටිමින් රටේ ආරක්ෂක හමුදාවන් බලගැන්වීමටත්, බෙදුම්වාදී ත්‍රස්තවාදය පරාජය කිරීමටත් සක්‍රීයව දායක වූ බව සිහිපත් කළේය. විශේෂයෙන්ම උතුර සහ නැගෙනහිර වෙන් කිරීමේ ඓතිහාසික නඩු තීන්දුව ලබා ගැනීමට තම පක්ෂය පුරෝගාමී වූ බවත්, ඒ සඳහා ගෝමින් දයාසිරි, එච්.එල්. ද සිල්වා සහ එස්.එල්. ගුණසේකර වැනි ශ්‍රේෂ්ඨ නීතිඥයන්ගේ සහාය නොමිලේම ලැබුණු බවත් ඔහු සඳහන් කළේය. 2008 වසරේදී ප්‍රතිපත්තිමය හේතූන් මත ජනතා විමුක්ති පෙරමුණෙන් ඉවත් වූ බවත්, වත්මන් ජවිපෙ එදා තිබූ ප්‍රතිපත්තිවලින් අංශක 180ක් වෙනස් වී ඇති බවත් ඔහු චෝදනා කළේය.

### *රාජ්‍යය සහ ජාතික ආරක්ෂාවට එල්ල වන තර්ජන:*

රාජ්‍යයක් පවතින්නේ යහපත් ජීවිතයක් සඳහා බවත්, ඒ සඳහා සාමය අත්‍යාවශ්‍ය කොන්දේසියක් බවත් වීරවංශ මහතා පෙන්වා දුන්නේය. එහෙත් වත්මන් පාලනය යටතේ රාජ්‍යයේ බලකණු එකින් එක බිඳවට්ටමින් පවතින බව ඔහු පැවසීය. මහා සංඝරත්නයට අපහාස කිරීම සහ ජාතික ආරක්ෂාව දුර්වල කිරීම මෙහි ප්‍රධාන අංග බව ඔහු සඳහන් කළේය. කිලිනොච්චිය, මුලතිව් සහ යාපනය යන ප්‍රදේශවල ආරක්ෂක හමුදා කඳවුරු ඉවත් කිරීමට හෝ දුර්වල කිරීමට රජය කටයුතු කරමින් සිටින බවත්, මෙය දෙමළ ඩයස්පෝරාවේ උවමනාවන් ඉටු කිරීමක් බවත් ඔහු ප්‍රකාශ කළේය.

### *රණවිරුවන් සහ බුද්ධි අංශ දඩයම:*

ආරක්ෂක හමුදාවන්ගේ සහ බුද්ධි අංශවල මානසිකත්වය බිඳවැට්ටවීමේ ක්‍රමානුකූල වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වන බව ඔහු පැවසීය. ජනාධිපතිවරයා "රණවිරු" යන වචනය පාවිච්චි කිරීමට පවා මැලි වන බවත්, නිදහස් දින පෙළපාළිවලදී හමුදාවේ කාර්යභාරය හැල්ලු කර ඇති බවත් ඔහු චෝදනා කළේය. ඇමරිකාව වැනි රටවල බුද්ධි අංශ නිලධාරීන්ට නීතිමය රැකවරණය තිබුණද, ලංකාවේ ඔවුන් සිරගත කරන බවත් මෙහි ප්‍රතිඵලයක් ලෙස නාවික හමුදා බුද්ධි අංශයේ පිරිස් බලය තුනෙන් එක දක්වා අඩු වී ඇති බවත් ඔහු අනාවරණය කළේය.

***මේජර් ජනරාල් සුරේෂ් සලේගේ භූමිකාව:***

මේජර් ජනරාල් සලේ මහතා යුද්ධයේදී කළ මෙහෙය සුවිශාල බවත්, එල්.ටී.ටී.ඊ. නායක තමිල්සෙල්වන් ඝාතනය කිරීමට අවශ්‍ය බුද්ධි තොරතුරු ලබා දුන්නේ ඔහු බවත් වීරවංශ මහතා සඳහන් කළේය. බුද්ධි අංශ ක්‍රියාත්මක වන්නේ සතුරාගේ අභ්‍යන්තරයේ සිට බවත්, ඒ නිසා ඔවුන්ට විවිධ පුද්ගලයන් සමඟ සම්බන්ධතා පැවැත්වීමට සිදු වන බවත් ඔහු පැහැදිලි කළේය. පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් සහරාන් ඇතුළු පිරිස අයි.එස්.අයි.එස්. (ISIS) සංවිධානය සමඟ සම්බන්ධ බවට ආරක්ෂක මණ්ඩලයට මුලින්ම අනතුරු ඇඟවූයේද සලේ මහතා ඇතුළු කණ්ඩායම බව ඔහු පෙන්වා දුන්නේය.

***<u>වත්මන් අත්අඩංගුවට ගැනීම සහ දේශපාලන අරමුණ:</u>***

සලේ මහතා අත්අඩංගුවට ගැනීම තනිකරම දේශපාලන දඩයමක් බවත්, එය කොටි ඩයස්පෝරාව සතුටු කිරීමට ගත් පියවරක් බවත් වීරවංශ මහතා පැවසීය. ඊබ්‍රාහිම් වැනි පාස්කු ප්‍රහාරයට සම්බන්ධ සැකකරුවන්ගේ දේපළ නිදහස් කරද්දී, රට බේරාගත් බුද්ධි අංශ නිලධාරීන් සිරගත කිරීම නරුම පාවාදීමක් බව ඔහු අවධාරණය කළේය. මෙම ක්‍රියාවලියේ අවසන් ඉලක්කය ගෝඨාභය රාජපක්ෂ මහතා බවත් ඔහු සඳහන් කළේය.

## ***<u>විමල් වීරවංශ මහතාගේ සම්පූර්ණ කතාව</u>***

***<u>හැඳින්වීම සහ පක්ෂයේ ඉතිහාසය:</u>***

"ජාතික නිදහස් පෙරමුණේ ප්‍රධාන ලේකම් විජයං සහෝදරයා ඇතුළු අපේ පක්ෂයේ දේශපාලන මණ්ඩලයේ සියලුම සහෝදරවරුනි, ඒ වගේම පක්ෂයේ ක්‍රියාකාරී සියලුම සහෝදර සහෝදරියනි, ඔබ සියලු දෙනාගෙන් අවසරයි. ජාතික නිදහස් පෙරමුණ හැටියට අපට වගකීමක් තිබෙනවා. අපි භාරගෙන තිබෙන ඓතිහාසික කාර්යභාරයක් තිබෙනවා. ඔබ දන්නවා ඒ කාර්යභාරයේ අපි කවදාක්වත් නිශ්චිත ප්‍රතිපත්තිමය ස්ථාවරයන්ගෙන් වෙනස් වුණේ නැති බව. අපි ජනතා විමුක්ති පෙරමුණ තුළ ඉන්දැද්දිත් දේශහිතෛෂී ජාතික ව්‍යාපාරය හරහා, මානෙල් මල් ව්‍යාපාරය හරහා මේ රටේ ආරක්ෂක හමුදාවන් බලගන්වන්නත්, බෙදුම්වාදී ත්‍රස්තවාදය පරාජයට පත් කරලා සිංහල, දෙමළ, මුස්ලිම් සියලු ජන

කොටස්වලට මේ රටේ සතුටින්, සමගියෙන්, සාමයෙන් ඉන්න පුළුවන් වතාවරණය ඇති කරන්නත් තීරණාත්මක මැදිහත් වීමක් කෙරුවා. ඉන් අනතුරුවත්, ඊට පෙර සුනාමි සහන මණ්ඩලය ඇතිවෙනකොට ඒක වළක්වන්න අපි එදා හිටපු පක්ෂය තුළ ඉඳගෙන විශාල මැදිහත්වීමක් කෙරුවා. ඒ විතරක් නෙවෙයි උතුර සහ නැගෙනහිර වෙන් කර ගැනීමේ ඓතිහාසික නඩු තීන්දුව නිර්මාණය කරගන්න පුළුවන් වුනෙත් එදා අපි පුරෝගාමීව ඒ කටයුත්තට කැප වෙච්ච හින්දා.

මට මතකයි එදා හිටපු ඒ ජ්‍යෙෂ්ඨ නීතිඥයන්, ගෝමන් දයාසිරි මැතිතුමාන් - එතුමා අද දිවංගතයි - මා තමයි මුලින්ම මේ සම්බන්ධයෙන් සාකච්ඡා කළේ. එතුමාගේ මග පෙන්වීම අනුව තමයි ඊට පස්සේ අපි ජනාධිපති නීතිඥ එච්.එල්. ද සිල්වා මැතිතුමන් ඒ වගේම එස්.එල්. ගුණසේකර මැතිතුමන් හමුවෙලා, ඒ ශ්‍රේෂ්ඨ නීතිඥයෝ සත පහක් නොගෙන රටේ අභිවෘද්ධිය වෙනුවෙන් එදා ඒ ඓතිහාසික නඩුවට පෙනී හිටියා. ඒ මගින් උතුර සහ නැගෙනහිර වෙන් කර ගැනීමේ ඓතිහාසික වගකීම හා යුතුකම ඉටු කරන්න අපට පුළුවන් වුණා. යුද්ධය පවතින අවස්ථාවේදීත් මහින්ද රාජපක්ෂ පාලනය 2005 දී නිර්මාණය කරන්න දායක වෙලා, මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා මගින් ත්‍රස්තවාදය පරාජයට පත් කරගත හැකියි කියන විශ්වාසය මත පිහිටලා අපි ඒ ජයග්‍රහණයේ සම්මාදම්කරුවෙකු බවට පත්වුණා.

අපි 2008 අප්‍රේල් 08 වෙනිදා පාර්ලිමේන්තුවේ විශේෂ ප්‍රකාශයක් කරමින් අපේ ප්‍රතිපත්තිමය රාමුව රැකගෙන එතනින් එළියට ආවේ ප්‍රතිපත්තිමය පදනම අතහරින දේශපාලන ව්‍යාපාරයක තවදුරටත් ඉන්න බැරි නිසයි. අද තියෙන ජනතා විමුක්ති පෙරමුණ අපි එදා හිටපු පක්ෂයට වඩා අංශක 180ක වෙනසකට භාජනය වෙලා තියෙනවා. රටට සාමය දිනා දෙන්න ත්‍රිවිධ හමුදාව සහ පොලීසිය උරදෙනකොට ඒ මහා ක්‍රියාන්විතයේ ආශ්වාදය මුළු රටම භුක්ති වින්දා. අදත් මේ ස්ථානයේ අපි ප්‍රාණ බියකින් තොරව මේ මුණගැහෙන්නේ මව්බිමේ සුජාත දූපුතුන් කරපු අනන්ත අප්‍රමාණ කැපවීම්වල ප්‍රතිඵලයක් හැටියටයි.

***<u>රණවිරුවන් සහ රාජ්‍යයේ වැදගත්කම:</u>***

අදත් රූපවාහිනී ප්‍රවෘත්ති දෙස බලාගෙන ඉන්න අබාධිත රණවිරුවන් මේ දකින දේවල් ගැන මොනවා හිතනවා ඇද්ද? ඔවුන් පය, ඇස්, ලේ දන් දුන්නේ අද මේ දකින විදියේ ප්‍රවෘත්ති දකින්නද?. ඇරිස්ටෝටල් කියන දර්ශනිකයාට අනුව රාජ්‍යය පවතින්නේ යහපත් ජීවිතයක් වැඩීමට රුකුල් දෙන්නයි; ඒ සඳහා **සාමය මූලික කොන්දේසියක්**. හේගල් කියන විදිහට රාජ්‍යය වනාහි මිහිපිට පවතින දිව්‍යමය සංකල්පයක්. ඒ රාජ්‍යයට එන අනතුර පරාජය කරන්න කැපවෙන අය තමයි අපේ යුගයේ වීරයන්.

රාජ්‍යය අපට නිදහස් අධ්‍යාපනය, සෞඛ්‍යය, මහපොළ ශිෂ්‍යත්ව සහ පාසල් නිල ඇඳුම් ලබා දුන්නා. නමුත් අද සමහරුන්ට ඕනෑ වී තිබෙන්නේ රාජ්‍යයේ ශක්තීන් රැකගන්න නෙවෙයි, රාජ්‍යය බිඳවට්ටන්නයි. රාජ්‍යයේ බලකණු එකින් එක දුර්වල කරලා බිඳවට්ටන්න හදනවා. ඉන්දියාව මේ රටේ බෙදුම්වාදී ත්‍රස්තවාදය පැලපදියම් කළ බව අපි දන්නවා. අද ටිල්වින් සිල්වා මහත්තයා ඉන්දියාව ගැන කියන කතා සහ ඔවුන් එදා උගන්වපු 'ඉන්දියානු ව්‍යාප්තවාදය' පන්තිය අතර තියෙන්නේ ලොකු පරස්පරයක්.

රෝහණ විජයවීර සහෝදරයා පවා කිව්වේ ජාතිකත්ව පදනමෙන් රාජ්‍ය බෙදා වෙන් කිරීම සතුරු ව්‍යායාමයක් බවයි.

***ජාතික ආරක්ෂාවට එල්ල වන ප්‍රහාර:***

අද එක පැත්තකින් මහා සංඝරත්නයට ගහනවා, උන්වහන්සේලාගේ ප්‍රතිරූපයට පහර දෙනවා. අනෙක් පැත්තෙන් රාජ්‍යයේ ප්‍රධානතම බලකනුවක් වන ජාතික ආරක්ෂාව ක්‍රමානුකූලව බිඳවට්ටමින් තියෙනවා. මේ වෙනකොට **කිලිනොච්චියේ සහ මුලතිව්වල හමුදා කඳවුරු ඉවත් කරමින් පවතිනවා**. යාපනය ආරක්ෂක හමුදා මූලස්ථානය පවා ඉවත් කිරීමට සාකච්ඡා යනවා. මෙය දෙමළ ඩයස්පෝරාවේ උවමනාව ඉටු කිරීමක්. අද ජනාධිපතිවරයාට 'රණවිරුවා' කියන වචනය පාවිච්චි කරන්න බැහැ; ඒ වචනය ඇහෙනකොට ඩයස්පෝරාවේ වගේම මෙයාගේ ඇඟත් නළියනවා. නිදහස් දින පෙළපාලිවලදී පවා හමුදාව කළ මෙහෙවර ගැන කියන්න ඉඩ දෙන්නේ නැහැ.

ඇමෙරිකාව වැනි රටවල තමන්ගේ බුද්ධි අංශ ආරක්ෂා කරන පනත් තිබුණත්, ලංකාවේ බුද්ධි අංශ නිලධාරීන් අත්අඩංගුවට ගන්නවා. මේ නිසා අද නාවික හමුදාවේ බුද්ධි අංශයේ ඉන්න ඕන ප්‍රමාණයෙන් ඉන්නේ තුනෙන් එකයි. අනුර කුමාර මහත්තයා විදෙස්ගත ශ්‍රී ලාංකිකයන්ට ඡන්ද බලය දෙන්න හදන්නේ ඩයස්පෝරාවට පාලනය කළ හැකි ඡන්ද පදනමක් හදන්නයි.

***මේජර් ජනරාල් සුරේෂ් සලේගේ භූමිකාව:***

දැන් අපි මේ කතා කරන මේජර් ජනරාල් සුරේෂ් සලේ මහත්මයා යුද්ධයේදී ඉටු කළ භූමිකාව අතිශය සුවිශාලයි. **එල්.ටී.ටී.ඊ. නායක තමිල්සෙල්වන් ඉලක්ක කරගත් ප්‍රහාරයට අවශ්‍ය නිවැරදි බුද්ධි තොරතුරු ලබා දුන්නේ ඔහුයි**. බුද්ධි අංශ කියන්නේ සතුරාගේ ඇතුළේ ඉඳගෙන තොරතුරු ගන්නා පිරිසක්; සතුරාගේ මිනිසුන් සමඟ සම්බන්ධතා පැවැත්වීම ඔවුන්ගේ රාජකාරියයි. සහරාන්ලා ISIS සමඟ සම්බන්ධ බවට ආරක්ෂක මණ්ඩලයට මුලින්ම අනතුරු ඇඟවූයේ සලේලායි. එදා ඒ අනතුරු ඇඟවීම් නොසලකා හැරපු පිරිස අද අනතුරු ඇඟවූ පුද්ගලයාවම අත්අඩංගුවට ගන්නවා.

මෙම අත්අඩංගුවට ගැනීම තනිකරම දේශපාලන දඩයමක්. ශානි අබේසේකරලා බොරු සාක්ෂි හදලා මේවා කරනවා. පාස්කු ප්‍රහාරයට අන්තවාදී මතවාදය දුන්නා කියන **ඊබ්‍රාහිම්ගේ දේපළ සහ රත්තරන් නිදහස් කරද්දී, රට බේරාගත් බුද්ධි අංශ ප්‍රධානියා හිරේ දානවා**. මෙහි ඊළඟ ඉලක්කය තමයි ගෝඨාභය රාජපක්ෂ මහත්තයා.

***නිගමනය සහ ජනතාවට කරන ආයාචනය:***

සලේ කියන්නේ මේ මහා තුච්ච පාහර දඩයමට එරෙහිව කරන සටනේ සංකේතයක්. ඔහු නිදහස් කරන තුරු අපි නොනවතින සටනකට අවතීර්ණ විය යුතුයි. කලිල් ජිබ්‍රාන්ගේ 'Pity the Nation' කවියෙන්

කියවෙනවා වගේ, ගහලයාගේ අසිපත පහළට එද්දී සටන් නොකරන ජාතිය තුච්චයි. සිංහලයකු රජපුටුවේ අසුන්ගෙන සිටියදී නිහඬව සිටින ජාතිය අහෝ ඔබ තුච්චයි.

අපි තීරණය කළ යුතුයි අපි තුච්ච ජාතියක් වෙනවද නැත්නම් ශ්‍රේෂ්ඨ ජාතියක් හැටියට නැගිටිනවද කියලා. සලේ නිදහස් කර ගැනීමේ සටන ඒ සඳහා වන ප්‍රධානතම සටනයි. රණවිරුවන්ගේ ආරක්ෂාව වෙනුවෙන් මුළු ජාතියම පෙළගැසෙන ලෙස මම ඉල්ලා සිටිනවා. ඔබට ජය වේවා!"